## තණමල්විල ප්‍රාදේශීය සභාව

### 1. මූල්‍ය ප්‍රකාශන

#### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 අප්‍රේල් 27 දිනද ,ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2011 මාර්තු 30 දිනද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2012 නොවැම්බර් 19 දින සභාවේ සභාපති වරයා වෙත යවන ලදී.

#### 1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව තණමල්විල ප්‍රාදේශීය සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් සභාපතිවරයාට යවන ලද මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2011 දෙසැම්බර් 31 දිනට තණමල්විල ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරීත්වය පිලිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරන ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිලිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිලියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

#### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළබඳ අදහස් දැක්වීම

##### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) සෙවනගල උප කාර්යාල ගොඩනැගිල්ල හා එහි පවතින කාර්යාල උපකරණ වල අගය තක්සේරු කර ගිණුම් ගත කර නොතිබුණි.

(ආ) හිටපු සභා ලේකම්වරයාට වැඩිපුර ගෙවන ලද නිවාඩු දින වැටුප් රු.98,626 ක් අයවිය යුතු මුදලක් ලෙස ගිණුම් ගතකර නොතිබුණි.

### 02. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

#### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,415,336 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.21,914 ක් විය.

## 2.2 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂයට අදාල අයවැය ලේඛනය අනුව ඇස්තමේන්තු කළ වියදම හා තථ්‍ය වියදම අතර 19% සිට 100% දක්වා විචලනයක් පෙන්නුම් කෙරෙන බැවින් වියදම් පාලනයේදී අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණ.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත<br>රු.<br>000' | තථ්‍ය<br>රු.<br>000' | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය<br>රු.<br>000' |
|---|---|---|---|---|
| (i) | බදු කුලී | 4,146 | 4,115 | 1,356 |
| (ii) | බලපත්‍ර ගාස්තු | 960 | 607 | - |
| (iii) | වෙනත් ආදායම් | 811 | 256 | - |

### 2.3.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම් වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 8,513,667 |
| (ii) | මුද්දර ගාස්තු | 91,050 |

### 2.3.3 දේපල බදු

ඩංඩුම සතිපොල, මහගම සතිපොල, තණමල්විල සතිපොල, හා ගවමස් කඩය, කිරි ඉබ්බන්ආර සතිපොල ,තණමල්විල මාළු ලැල්ල හා ඩංඩුම ගව මස් කඩය බදු දී තිබූ බදු කරුවන්ගෙන් අයවිය යුතු හිඟ බදු මුදල්, ප්‍රමාද ගාස්තු හා අනෙකුත් ගාස්තු රු.818,350 ක් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 (1) (ආ) වගන්තිය ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3.4 **කඩ කාමර බදු**

දිගු කලක සිට කුලී මුදල් ගෙවීම පැහැර හැර තිබූ කඩ කාමර 25 කින් 2011 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ රු.427,550 ක් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159 (1) වගන්තියේ විධිවිධාන ප්‍රකාර අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3.5 **සතිපොළ බදු**

තණමල්විල හා ඩංඩුම සතිපොළ බදු අය කිරීමේදී එකතු කළ අගය මත බදු රු.252,743 ක් අඩුවෙන් අයකර තිබුණි.

2.3.6 **වෙළඳ බලපත්‍ර ගාස්තු**

2005 වර්ෂයෙන් පසු බලපත්‍ර ගාස්තු ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

2.4 **ආර්ථික නොවූ ගනුදෙනු**

2010 නොවැම්බර් මාසයේදී සභාවේ කැබ් රථයේ අළුත්වැඩියාවක් සඳහා පෞද්ගලික ආයතනයකට රු.1,174,351 ක් ගෙවා තිබුණි. 2011 මාර්තු 30 දිනැති ඌව පළාත් යාන්ත්‍රික ඉංජිනේරුවරයාගේ පරීක්ෂණ වාර්තාව අනුව අළුත්වැඩියාවට අදාල වූ යාන්ත්‍රික දෝෂයන් නැවත ඇති වී ඇති බව දන්වා තිබුණු අතර, ඒ බව වාහන අළුත්වැඩියා කළ ආයතනයට දන්වා යැවීම හැර වෙනත් විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

2.5 **ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

**පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.**

(අ) 2006 අප්‍රේල් 10, 2006 මැයි 26, 2006 අගෝස්තු 01 හා 2007 අගෝස්තු 01 දිනැති පිළිවෙලින් කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 28, 28(i), 28 (ii) හා 36 ට පටහැනිව සහ 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 19 (1)(i) වගන්තිය ප්‍රකාර පළාත් පාලන කොමසාරිස්වරයාගේ පූර්ව ලිඛිත අනුමැතියක් නොලබා 2011 වර්ෂය තුල නව පත්වීම් 03 ක්ද ඇතුළුව පත්වීම් 31 ක් ලබා දී 2011 දෙසැම්බර් 31 දින වන විට වැටුප් හා දීමනා, සේවක අර්ථ සාධක අරමුදල් සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් දායකය වශයෙන් රු.4,919,926 ගෙවා තිබුණි.

(ආ) සභාවේ කැබ් රථය සඳහා අනුමත ඉන්ධන සීමාව ඉක්මවා රු. 20,434 ක් වූ ඉන්ධන ලීටර් 257 ක් මිලදීගෙන තිබුණ ද පළාත් පාලන කොමසාරිස්වරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ඇ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 (ඒ) සහ (ඔ) වගන්තිවල විධිවිධාන වලට පටහැනිව අමාත්‍යවරයාගේ පූර්ව ලිඛිත අනුමැතිය ලබා නොගෙන සුභසාධන වියදම් රු.35,000 ක් සභා අරමුදලින් ගෙවා තිබුණි.

## 2.6 අවිධිමත් ගනුදෙනු

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) තණමල්විල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මාර්ග සංවර්ධනය වෙනුවෙන මෝටර් ග්‍රේඩර් කුලිය සඳහා රු.750,523ක 2010 මැයි සිට අගෝස්තු දක්වා කාලය තුල කාර්මික නිලධාරීගේ නිර්දේශ හා නිමි වැඩ වාර්තා නොමැතිව ගෙවා තිබුණි. එවකට සිටි සභාපති වරයා විසින් පෞද්ගලිකව අධීක්ෂණය කර මෙම කාර්යය ඉටුකර ඇති බව දක්වා කාර්මික නිලධාරි විසින් එකී නිර්දේශ හා වාර්තා ලබාදීම ප්‍රතික්ෂේප කර තිබුණි. මේ අනුව මෙම ගෙවීම් අනුමත කළ හා සහතික කළ නිලධාරීන් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 137,138 හා 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 113 වගන්තියට පටහැනිව කටයුතු කර ඇති බව නිරීක්ෂණය වේ.

(ආ) 2011 ජනවාරි සිට ඔක්තෝබර් 14 දින දක්වා නිකුත් කර තිබු වීථි රේඛා සහ නොපවරා ගැනීමේ සහතික 57 කින් එක් සහතිකයක් පමණක් කාර්මික නිලධාරීගේ නිර්දේශ සහිතව සභාපතිවරයා විසින් නිකුත් කර තිබු අතර අනෙකුත් අවස්ථා 56 දීම කාර්මික නිලධාරි නිර්දේශ ලබා නොගෙන ලේකම්වරයා විසින් සහතික කර තිබුණි.

(ඇ) රජයේ ප්‍රසම්පාදන ක්‍රියාමාර්ග අනුගමනය නොකර සභාව විසින් විවිධ කාර්යයන් සඳහා යොදවාගත් පෞද්ගලික වාහන සඳහා රු.57,750 ක් වාහන කුලි වශයෙන් ගෙවා තිබුණි.

(ඈ) ප්‍රාදේශීය සභා ගොඩනැගිලි සැලසුම් කමිටුව 2011 වර්ෂයේදී කාලීනව රැස්වීම් පවත්වා නොතිබු අතර වර්ෂයේදී දෙවතාවක් පමණක් රැස්වී තිබුණි. වර්ෂය තුලදී කමිටුව වෙත ඉදිරිපත් කර තිබු අයදුම්පත්‍ර 15 කින් 03 ක් පමණක් කමිටුව විසින් අනුමත කර තිබු අතර කමිටුවේ නිර්දේශ නොමැතිව අයදුම් පත්‍ර 07 ක් සභාපතිවරයා විසින් පෞද්ගලිකව අනුමත කර බලපත්‍ර ලබා දී තිබුණි.

(ඉ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 (අ) වගන්තටයෙ විධිවිධාන වලට පටහැනිව ප්‍රසම්පාදන ක්‍රියාමාර්ග අනුගමනය නොකර රු.79,215 ක වටිනාකමට ඉදිකිරීම් ද්‍රව්‍ය හා කාර්යාල උපකරණ මිලදී ගැනීම් කර තිබුණි.

(ඊ) සභාවේ වැඩ බලන සභා ලේකම් වශයෙන් කටයුතු කළ රාජ්‍ය කළමනාකරණ සේවයේ 1 පන්තියේ නිලධාරියකුට නිවාඩු දින වැටුප් ගෙවීමේදී මාසික වැටුපෙන් 1/30 ක් වෙනුවට 1/20 බැගින් ගෙවීම නිසා 2006 ජුනි සිට 2011 සැප්තැම්බර් දක්වා වැඩිපුර රු. 98,626 ක් ගෙවා තිබුණි.

(උ) දක්ෂිණ සංවර්ධන අධිකාරියේ ප්‍රතිපාදන මත ඉටු කරන ලද සෙවනගල ගැමුණුපුර වටරවුම් පාර අළුත්වැඩියා කිරීමේ කර්මාන්තය තණමල්විල ප්‍රාදේශීය සභාව විසින් ඉටු කරන ලද බවට සාවද්‍ය ලියකියවිලි සකස් කර රු.564,686 ක මුදලක් සභා අරමුදලින් ගෙවා තිබුණි. කෙසේ වුවද මෙම වරද අදාල කොන්ත්‍රාත්කාර සමිතිය විසින් පිළිගෙන ඇති බවත් ඔවුන් ගණනය කළ ආකාරයට වැරදි සහගත ලෙස ලබා ගත් රු.399,499 ක මුදල සභා අරමුදලට 2011 ජුලි 29 දින ආපසු ගෙවා ඇති බවත් වාර්තා වී ඇත. සාවද්‍ය ලියකියවිලි සකස කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව නීතිමය පියවර ගෙන නොතිබුණි.

(ඌ) සභා බල ප්‍රදේශය තුළ මාර්ග සංවර්ධන කටයුතු වෙනුවෙන් යොදාගත් මෝටර් ග්‍රේඩර් වලට ඩීසල් ලීටර් 4107 ක් මිලදී ගැනීම වෙනුවෙන් 2010 ජුනි සිට අගෝස්තු දක්වා කාලය තුල රු.301,463 ක මුදලක් ගෙවා තිබුණි. එහෙත් මෝටර් ග්‍රේඩර් සපයන ලද ආයතන විසින් ඉදිරිපත් කර ඇති බිල්පත්‍ර අනුව ඔවුන් විසින් ලබාගෙන ඇත්තේ ඩීසල් ලීටර් 3515 ක් බව නිරීක්ෂණය විය. මේ අනුව ඩීසල් ලීටර් 592 කට වැඩිපුර ගෙවා ඇති මුදල රු.43,462 ක් විය.

(එ) සභාව විසින් මාර්ග සංවර්ධන කටයුතු සඳහා යොදාගත් මෝටර් ග්‍රේඩර් කුලී ගෙවීම වෙනුවෙන් 2010 අගෝස්තු මස 19 දින අංක 55 දරණ වවුචරය මත රු.128,295 ක් වටිනා චෙක්පතක් පෞද්ගලික ආයතනයක් නමින් ලියා තිබුණි. පසුව මෙම චෙක්පතේ ආදායකයාගේ නම කපා හැර සභාවට සම්බන්ධ පුද්ගලයකුගෙ නම ලියා අවශ්‍ය අත්සන් තබා බැංකුවෙන් මුදල් ලබා ගෙන ඇති බැව් අනාවරණය විය. අක්‍රමිකතාව සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් කර අදාල පාර්ශවයන්ට විරුද්ධව නීති මඟින් කටයුතු කර නොතිබුණි.

## 2.7 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

**පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.**

(අ) නිමි වැඩ වාර්තාවක් සහ නිසි අයුරින් කළ බවට වු කාර්මික නිලධාරි නිර්දේශ රහිතව ට්‍රැක්ටර් ටේලරයක් අලුත්වැඩියා කිරීම වෙනුවෙන් රු.97,570 ක් ගෙවා තිබුණි.

(ආ) සභාවේ කැබ් රථයේ අනියම් රියදුරු කැබ් රථය 2011 ජනවාරි 12 දින ආපසු භාර දීමේදී වාහනයට සවිකර තිබු ගුවන් විදුලි යන්ත්‍රය නොමැති බව විෂය භාර නිලධාරියා වාර්තා කර තිබුණද ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියා මාර්ගයක් නොගෙන සභා අරමුදලින් රු.4,080 ක් වටිනා ගුවන් විදුලි යන්ත්‍රයක් අළුතින් මිලදී ගෙන සවි කර තිබුණි.

(ඇ) 2011 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබුණ ගෙවිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු.977,031 ක් විය.

(ඈ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ රීති 141 විධිවිධාන වලට පටහැනිව පරිපූරක ඇස්තමේන්තු අනුමත කර නොගෙන අයවැය ගත ප්‍රතිපාදන ඉක්මවා රු.1,061,088 ක වියදම් දරා තිබුණි.

(ඉ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන ) රීති 203 ප්‍රකාරව සභාවේ දේපළ සම්බන්ධයෙන් පූර්ණ සමීක්ෂණයක් හා 214 රීතිය ප්‍රකාර 2003 වර්ෂයෙන් පසු ගබඩා ද්‍රව්‍ය පිළිබඳ සමීක්ෂණයක් කර නොතිබුණි.

(ඊ) 2011 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය හා අත්තිකාරම් රු.1,655,405 ක් වූ අතර අවුරුදු 01 ක කාලයක් ඉක්මවා අය වීම හිඟ හිටි ගිණුම් ශේෂවල එකතුව රු.738,793 ක් විය.

## 3. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) අභ්‍යන්තර පාලනය

(ආ) ආදායම් පරිපාලනය